කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

සමූහය

වියාචනය කළ මතය

සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. සමූහයේ මතය වියාචනය සඳහා පදනම කොටසේ (1.2) සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වියාචනය කළ මතය සඳහා පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා විසින් තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කරමි.

සමූහය තුළ ඇති ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා විසින් වියාචනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

සමූහය තුළ ඇති ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.3 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා විසින් වියාචනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන

කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ

සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය සහ සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන

1.5.1 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන

1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි 04 වන ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ශේෂ අතර වෙනස රු.මිලියන58.65 ක් ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ ගැලපීම සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා පවත්වාගෙන යන ජංගම ගිණුම් වල සත්‍ය මුදල් ගලා ඒම රු. මිලියන 1,724.34 ක් සහ සත්‍ය මුදල් ගලා යාම රු. මිලියන 1,475.25 ක් මෙහෙයුම් මුදල් ප්‍රවාහය තුළ හඳුනා ගෙන නොතිබීම නිසා මෙහෙයුම් මුදල් ප්‍රවාහය රු.මිලියන 190.44 කින් ඌණ ගණනය වී තිබුණි. එමෙන්ම මුදලින් ගෙවන ලද රු. මිලියන 2.14 ක් වූ සේවක වෛද්‍ය රක්ෂණ ගාස්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම වටිනාකමෙන් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි. තවද සේවක වෛද්‍ය රක්ෂණ අරමුදල් ගිණුමේ ශේෂ වෙනස රු මිලියන 8.96 ක වැඩි වීම ආයෝජන මුදල් ප්‍රවාහය තුළ වාර්තා කිරීම නිසා ආයෝජන මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණු අතර ආයෝජන මත ලද පොලිය වූ රු. මිලියන 5.7 ක් ආයෝජන මුදල් ප්‍රවාහය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ආයෝජන මුදල් ප්‍රවාහය ඌණ ගණනය වී තිබුණි.	සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකළ ගණුදෙනු වලින් සිදු වූ බලපෑම හා යෝජනාක්‍රම අතර ගණුදෙනු වාර්තා කරන ජංගම ගිණුම්වල බලපෑම මෙහෙයුම් කටයුතු තුළින් වූ මුදල් ප්‍රවාහයන් තුළ ගැලපීම් සිදුකර ඇත. සේවක වෛද්‍ය රක්ෂණ අරමුදල ශේෂ පත්‍රයේ හිමිකම් ලෙස දක්වා ඇත. මෙම අරමුදල සඳහා මුදල් ගලා ඒම සහ මුදල් ගලා යෑම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. ආයෝජන ක්‍රියාකාරකම් තුළ වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල සඳහා ලද රු.මිලියන 5.22 ක මුදල ද වර්ෂය තුළ ආයෝජන ආදායම රු.මිලියන 5.88 ක මුදලද ඇතුළත් කර ඇති අතර එම අරමුදල තුලින් ප්‍රතිලාභ ගෙවීම රු.මිලියන 2.14 ක මුදලකි. ඒ අනුව, ආයෝජන ක්‍රියාකාරකම් තුල වෛද්‍ය ප්රතිලාභ අරමුදලේ ශුද්ධ වැඩිවීම ලෙස රු.මිලියන 8.96 ක් ලෙස දක්වා ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 සිට 2022 වර්ෂය දක්වා වගාහානි රක්ෂණ වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මණ්ඩලයේ අවසන් ගිණුම් තුළ දක්වා තිබුණු රු. මිලියන 4,249.62 ක ලැබිය යුතු ආදායම 2023 වර්ෂයේදී මුළු මුදලම සමුච්චිත අරමුදල හර කර කපා හැර තිබුණි. 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත අනුව මෙහෙයුම් ආදායමින් සියයට 5 ක් ගොවිජන රක්ෂණ අරමුදලට මාරුකරන බැවින් ඉහත මුදලට අදාළව එලෙස මෙහෙයුම් ආදායමින් මාරුකළ රු.මිලියන 212.48 ක මුදල 2024 දෙසැම්බර් 31 දින දක්වා ගොවිජන රක්ෂණ අරමුදලින් ඉවත් කර සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව උපචිත පදනම මත ලැබිය යුතු වගා හානි වන්දි ගෙවීම් මත ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙහිදී 2018 හා 2019 වර්ෂයන් සඳහා මහාභාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන වෙන්කර නමුත්, ඊට පසු වර්ෂයන් වලදී අදාළ වන්දි මුදල ගෙවීමට පමණක් අදාළ මුදල් මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු කිරීම නිසා රු.මිලියන 4,250 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත වී තිබුණි. නමුත් මහා භාණ්ඩාගාරය විසින් එම මුදල් ලබා දීමට හැකියාවක් නොමැති නිසා ගිණුම් තුලින් කපාහැරීම සඳහා අනුමත කරන ලදී. එම වර්ෂයන්හිදී ලද මෙහෙයුම් ලාභය මත නිවැරදිව සංචිත වෙන්කිරීම සිදුකර ඇත.	ආදායම කපා හැරීමේදී,ඒ මත පදනම්ව මෙහෙයුම් ආදායමින් ගොවිජන රක්ෂණ අරමුදලට මාරුකිරීම් ආපසු ගැලපිය යුතුය.
(ආ)	මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන නගරවල පිහිටි නිල නිවාස 3 පිහිටි පර්චස් 76.6 ක් වූ ඉඩම් මණ්ඩලයට අයිතිව තිබුණ ද එම ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.	මහියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම් වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය.

1.5.2 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

1.5.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම, ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළ දී ලද රු.මිලියන 143.56 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අවප්‍රමාණය වී තිබුණි.	දායකයින්ගෙන් අය කරන වාර මුදල් වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේදී ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින්, අයකළ වාර මුදල් සහ ඊට අදාළ පොලී මුදලේ එකතුව මණ්ඩලයේ අරමුදල් ගිණුමට ගැලපීම් කර ඒ තුළින් අනාගතයේදී ගෙවිය යුතු වගකීම් සඳහා අරමුදල ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. ආයුගණක තක්සේරුවක් සිදු කිරීමෙන් පසුව ගොවීන්ගේ වගකීම නිශ්චිතව හඳුනාගෙන එහිදී කිසියම් මුදලක් ඉතිරි වේ නම් එම මුදල ආදායමක් ලෙස හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය අනුව වාරික ආදායම හා ආයෝජන පොලිය ආදායමක් ලෙස හඳුනාගත යුතුය.

(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදය ප්‍රකාරව දායකයින්ගෙන් ලද රු.මිලියන 135.44 ක්, වාරික මුදල් ආදායම මෙහෙයුම් ආදායම තුළ හඳුනා නොගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අව තක්සේරු වී තිබුණු අතර රු. මිලියන 8.12 ක් ආයෝජන ආදායම තුළ හඳුනා නොගැනීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි.	ගොවීන් ගෙවනු ලබන වාරික මුදල් මණ්ඩලය විසින් නැවත ගොවීන් වෙත ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින් එම වාර මුදල් ලැබීම් මණ්ඩලීය මෙහෙයුම් ආදායමක් ලෙස හඳුනා ගෙන නොමැත. වාර මුදල් ආයෝජන තුළින් ලද ආයෝජන වටිනාකම මූල්‍ය ක්‍රියාකාරකම් තුළ දක්වා ඇත. මෙම වාර මුදල් අය කිරීමෙන් ලැබෙන මුදල් ගොවීන් වෙත නැවත ගෙවීම සඳහා අරමුදල් රැස්කරන අතර, එය මණ්ඩලයේ වගකීමකි. එම වාර මුදල් හා ආයෝජන තුළින් ලද මුදල් වලින් ජනිත වූ පොලි ආදායම එම අරමුදලට ගලපා ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වාරික ආදායම හා ආයෝජන ආදායම සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඇ)	වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩුකළ විට ලැබෙන අවසාන ශේෂයට සියයට 11 ක් එකතු කර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කරමින් පැවතුණි. ඒ අනුව 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වූ රු.මිලියන 86,898.44 න් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම වූ රු.4,845.12 අඩු කර එම ශේෂයට සියයට 11 ක් වූ රු.මිලියන 9,025.86 එකතු කොට අවසාන ශේෂය වූ රු.මිලියන 91,079.18 විශ්‍රාම වැටුප් වගකීම වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 වගන්තිය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව ඉහතින් සඳහන් කරන ලද ක්‍රමය අනුගමනය කරමින් ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීමේ නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත් විය නොහැක.	ආයු ගණක තක්සේරුව සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළද ඒ සඳහා ආයු ගණකවරයෙක් හෝ කිසිදු ආයතනයක් ඒ සඳහා ඉදිරිපත් නොවීය. ඒ අනුව අවසන් වරට සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන අදාළ ගණනය කිරීම් සිදු කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයුගණක තක්සේරුව සිදු කළ යුතුය.

1.5.2.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළව ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම පිළිවෙලින් රු.මිලියන 8.97 ක් හා රු.මිලියන 8.97 ක් වූ අතර එම වටිනාකම් ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 17.94 කින් අවතක්සේරු වී ඇති අතර ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී ඇත.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	විශ්‍රාමිකයින්ගේ දායකත්වය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(ආ)	යෝජනා ක්‍රමයේ සමූහ ජීවිත රක්ෂණ ආවරණය මගින් වයස අවුරුදු 18-54 ත් අතර දායකයකු විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මරණයට පත් වීම, පූර්ණ හා අර්ධ බෙලහීනතාවයට පත් වීම, වෙනුවෙන් ගෙවීමට සිදුවන පාරිතෝෂික ගෙවීම සඳහා 2024 වර්ෂයේදී දායකයින් 266,297 ක් වෙනුවෙන් රු.මිලියන 15.98 ක අගයක් වෙන් කර තිබුණු අතර ඉන් 256,616 ක් අක්‍රිය දායකයික් වූ අතර ඔවුන්ගෙන් මිය ගිය ප්‍රමාණය හා සත්‍ය වශයෙන්ම අක්‍රිය වන දායකයින් ගණන තහවුරු කර ගැනීමකින් තොරව ඇස්තමේන්තු කර තිබුණි.	ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ආයුගණක තක්සේරුවක් ලබා ගැනීම සමඟම මෙම අරමුදල සඳහාද ආයුගණක තක්සේරුවක් සිදුකර පසු මෙම වගකීම නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරන බව පෙන්වා දෙමි.	සක්‍රීය දායකයින් හඳුනාගෙන සමූහ ජීවිත රක්ෂණ වාරිකය සඳහා වෙන් කිරීම් කළ යුතුය.

1.5.2.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.මිලියන 3,062.15 ක් සහ මුළු වගකීම් රු. මිලියන 94,351.63 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු. මිලියන 91,289.48 ක්ද, මුළු ජංගම වත්කම් රු. මිලියන 1,125.05 ක් සහ මුළු ජංගම වගකීම් රු. මිලියන 3,222.01 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු. මිලියන 2,096.96 ක්ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගත වේ.	රජයේ දායකත්වය ලෙස (මූලික ප්‍රාග්ධනය) රු.මිලියන750ක අරමුදලක් යෙදවීමට යෝජනා කර තිබුණද මණ්ඩලය වෙත එය හිමි නොවීය. මේ වන විට විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර,යෝජනා ක්‍රමය සඳහා අරමුදල් නොමැතිකමත්, වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ප්‍රතිලාභ මුදල වැඩිකිරීම හේතුවෙන් හා ක්‍රමිකව ගොවීන්ගේ දායකත්වය අඩුවීම තුළින් මෙම තත්වය උදා වී ඇති අතර,සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවනු ලබයි.	යෝජනා ක්‍රමය තුළ වත්කම් නොඉක්මවන ලෙස වගකීම් පවත්වා ගත යුතුය.

1.5.2.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන් මත හිමිකම් ලබාගැනීමට ඉදිරිපත් නොවන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2024 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.මිලියන 469.25 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.මිලියන 99.25 ක් විය. එම ශේෂයන් සෑදී ඇති ආකාරය හා එක් එක් ගොවීන් පිළිබඳ විස්තර ඇතුළත් තොරතුරු පද්ධතියක් නොවූ බැවින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.	නොගෙවූ විශ්‍රාම වැටුප් වලට අදාළව එම දායකයින්ගේ විස්තර ඇතුළත් වාර්තාවක් මණ්ඩලය වෙත එවන ලෙස දිස්ත්‍රික් දිසා ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, මේ වන විට මාසිකව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා නොගත් දායකයින්ගේ වාර්තාවක් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. තැපැල් දෙපාර්තමේන්තු ගණකාධිකාරීවරුන් දැනුවත් කර ප්‍රමාදයකින් තොරව අදාළ වාර්තා ගෙන්වා ගැනිමට කටයුතු කරනු ලැබේ.	හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ඒ අනුව වාරික නිදහස් කළ යුතුය.

1.5.3 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මූල්‍ය ප්‍රකාශන

1.5.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩුකළ විට ලැබෙන අවසාන ශේෂයට සියයට 11 ක් එකතුකර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කරමින් පැවතුණි. ඒ අනුව 2024.01.01 දිනට ආරම්භක ශේෂය වූ රු.මිලියන 5,532.35 ට ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම රු.මිලියන 88.35 අඩු කර ශේෂයට සියයට 11 ක රු.මිලියන 598.84 පොලියක් එකතු කොට අවසාන ශේෂය ලෙස රු.මිලියන 6,042.84 වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 වගන්තිය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව එයට පටහැනිව ඉහත පරිදි විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම විගණනයේදී පිළිගත නොහැකිය.	ධීවර විශ්‍රාම වැටුප් වගකීම හා යෝජනා ක්‍රමයේ සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ වාර්ෂික වගකීම ආයු ගණක තක්සේරුවක් ලබා ගැනීමෙන් පසු හා ධීවර විශ්‍රාම වැටුප් වගකීම ඒ අනුව ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. අවසන් වරට සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන අදාළ ගණනය කිරීම් සිදු කර ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණක තක්සේරුව සිදු කළ යුතුය.

1.5.3.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු වටිනාකම රු.මිලියන 429.49 ක් වූ අතර එම වටිනාකමින් 2023 වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු කිරීමේදී වැඩියෙන් ගණනය කර තිබුණු වටිනාකම වූ රු.මිලියන 16.52 ක් අඩුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම එම අගයෙන් අවතක්සේරු වී තිබුණි.	මෙම තත්ත්වය නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව පෙන්වා දෙමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ යුතුය.

1.5.3.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.මිලියන 743.33 ක් සහ මුළු වගකීම් රු.මිලියන 6,125.28 ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.මිලියන 5,381.95 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.	මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ	යෝජනා ක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් සෘණ අගයක් වීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි.

1.6 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ නිලධාරීන් සඳහා ලබා දී තිබුණු වර්ෂ 10 ක් හා 25 ක් අතර කාලයක් ගතවූ රු.මිලියන 0.43 ක් හා වර්ෂ 25 කට වැඩි කාලයක් ගතවූ රු.මිලියන 0.15 ක් වූ ආපදා ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.	දීර්ඝ කාලීනව අය නොවන මෙම ශේෂයන් ගිණුම් වලින් කපා හැරීම සඳහා විගණන හා කළමණාකරණ කමිටු නිර්දේශ පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු 2025 වර්ෂය තුළ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ආපදා ණය ශේෂ අයකර ගත යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2000 අංක 43 දරන රක්ෂණ පාලන පනතේ අංක 12(3)(1) වගන්තිය හා 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතේ 29 වගන්තිය	මණ්ඩලය විසින් සිදු කරන කෘෂිකාර්මික රක්ෂණ කාර්යයන් සඳහා රක්ෂණ පාලන පනතේ රක්ෂණ පාලන අධිකාරිය විසින් නියාමනයක් අවශ්‍ය නොවුවද මෙම කෘෂිකාර්මික නොවන තෙවන පාර්ශව රක්ෂණ කටයුතු සඳහා රක්ෂණ නියාමන කොමිසමේ අධීක්ෂණයක් හා එහි නීති රීති ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.	මණ්ඩලය විසින් රක්ෂණ යෝජනා ක්‍රම ලබාදිය යුතු වන්නේ කෘෂි උපකරණ හා මෙවලම් සඳහා පමණක් නොව කෘෂිකාර්මිකයා සතු සියළු නිශ්චල හා චංචල දේපල සඳහාද වේ. 2000 අංක 43 දරන රක්ෂණ පාලන පනතේ 12(3) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා නීතිමය බාධාවක් නොමැත. තවද 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 29 වන වගන්තිය ප්‍රකාරව "රක්ෂණ පාලන පනතේ හෝ වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර, යම් ගැටුමක් හෝ අනුකූලතාවයක් ඇති වූ අවස්ථාවක මේ පනතේ විධිවිධාන ඒ වෙනත් යම් නීතිය අභිබවා බලපැවැත්විය යුතුය" යන්න සඳහන් කර ඇත. ඒ අනුව මණ්ඩලය අවශ්‍ය අවස්ථා වලදී රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නීති රීති අදාළ කරගනු ලබයි.	වාහන සඳහා තෙවන පාර්ශව රක්ෂණය සඳහා රක්ෂණ නියාමන කොමිසමේ නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අරමුණ ගොවි ජනතාවගේ සුභසාධනය වුවද මණ්ඩලය එම අරමුණෙන් බැහැරව තෙවන පාර්ශව රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. 2007 වර්ෂයේදී ට්‍රැක්ටර් සඳහා පමණක් තෙවන පාර්ශව රක්ෂණ නිකුත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු අවසරය මෙන්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය අනුව කෘෂි යන්ත්‍ර සඳහා පමණක් රක්ෂණ සහතික නිකුත් කිරීමට බලය ඇති බව දක්වා තිබුණද ඊට පටහැනිව අනෙකුත් වාහන සඳහා තෙවන පාර්ෂව රක්ෂණ නිකුත් කිරීම 2015 වර්ෂයෙන් පසු ආරම්භ කර තිබුණි.	පනතේ (7) වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් ඉටුකළ යුතු කර්තව්‍යයන් අනුව තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත්තේ මණ්ඩලය පිහිටුවීමේ මූලික අරමුණක් වන කෘෂිකාර්මිකයන්ගේ සුභසාධනය හා ආරක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ දේපල ආරක්ෂණය වෙනුවෙනි. ඒ අනුව මෙම යෝජනා ක්‍රමය මණ්ඩලය පිහිටුවීමේ අරමුණින් බැහැරව යාමක් නොවේ. 2007 වර්ෂයේදී කෘෂිරක්ෂණ මණ්ඩලය විසින් ට්‍රැක්ටර් රක්ෂණය කිරීම ආරම්භ කල අතර එහිදී නීතිපති දෙපාර්තමේන්තුවෙන් ට්‍රැක්ටර් වාහන රක්ෂණය සඳහා උපදෙස් ලබාගෙන පනතේ 7(ආ) වගන්තිය ප්‍රකාරව හා 29 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නීතිමය බාධාවක් නොමැත. තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වෙනත් පෞද්ගලික රක්ෂණ සමාගමක් අභියාචනාධිකරණය තුළ 2019 වර්ෂයේ නඩුවක් ගොනුකර තිබුණි.(නඩු අංක - CA.WART-0269-19) මෙහි නීති කටයුතු වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිටි අතර නඩු කටයුතු අවසන් කිරීමට (2023/02/14 දින) තීන්දු කර ඇත. ඒ අනුව මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තිබූ නෛතික ගැටලු සහගත තත්ත්වය ඉවත් විය. එසේ නිමා වූ නඩු කටයුතු ගණන 07 කි. තවද, රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් හිමිකම් නිරාකරණය කිරීම සඳහා නිකුත් කරන ලද 2024-03 චක්‍රලේඛය මණ්ඩලය වෙත අනුකූල කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර එම චක්‍රලේඛය මණ්ඩලය තුළ ක්‍රියාත්මක කරනු ලබයි.	ට්‍රැක්ටර් හැර අනෙකුත් වාහන තෙවන පාර්ශව රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා නීතිපති අනුමැතිය ලබා ගත යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i).	මු.රෙ 381	මණ්ඩලයේ බැංකු ගිණුම් 45 ක්ද ඇතුළුව සමූහයේ බැංකු ගිණුම් 57 ක් සඳහා භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 30 හි කටයුතු කිරීම සඳහා,එනම් වාර මුදල් රැස්කිරීම, ගෙවීම් පියවීම ආදිය සම්බන්ධයෙන් අධක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.	බැංකු ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.
(ii).	මු.රෙ 387	චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර, කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම්ය. නමුත් කෑගල්ල, වවුනියාව හා ගම්පහ යන දිස්ත්‍රික් කාර්යාල මුදල් පොතේ බැංකු ශේෂය ඉක්මවා චෙක්පත් ලියා තිබුණි.	ප්‍රධාන කාර්යාලය මගින් දිස්ත්‍රික් කාර්යාල ජංගම ගිණුම් වෙත දිස්ත්‍රික් කාර්යාලවල අවශතාවයන් සඳහා මුදල් බැර කරනු ලැබේ. එහිදී ජංගම ගිණුම් වෙත බැර කරන ලද මුදල්, මුදල් පොතේ වැරදියට සටහන් කර ජංගම ගිණුමෙන් මුදල් ඉවත් කර ගැනීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා අදාළ දිස්ත්‍රික් කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇති අතර, මේ වන විට එම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	මුදල් පොත් නිවැරදිව පවත්වා ගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13:4 වගන්තිය	පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩ බැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතු බව දක්වා තිබුණද සංවර්ධන නිලධාරී තනතුර සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම් නොමැති නිලධාරීන් 05 දෙනෙකු සංවර්ධන නිලධාරි තනතුරුවල සහ එක් නිලධාරියෙක් අධ්‍යක්ෂ(පාලන) තනතුරෙහිද, මාස 07 සිට අවුරුදු 4 දක්වා කාලයක් දිගින් දිගටම වැඩ බැලීමේ කාලය දීර්ඝ කරමින් පත්වීම් ලබා දී තිබුණි.	පසුගිය වසර වලදී රජය විසින් රාජ්‍ය ආයතන වෙත නිලධාරින් බඳවා ගැනීම් සීමා කර තිබුණු බැවින් අදාළ රාජකාරි ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය නිලධාරින් පමණක් බඳවා ගන්නා ලදී. මේ වන විට පුරප්පාඩු වි ඇති තනතුරු සඳහා නිලධාරින් බඳවා ගැනීම් සඳහා ලිපි මගින් අග්‍රමාත්‍ය කාර්යාලයෙන් අනුමැතිය ඉල්ලුම් කර ඇත.	වැඩ බැලීමේ තනතුර සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් පත් කළ යුතුය.

(ඉ)	2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පටිපාටි රීති සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රයේ IX පරිච්ඡේදයේ 131 වගන්තිය	නීතියට පටහැනිව තනතුරු 09 ක් සඳහා නිලධාරින් 22 ක් මාස 06 සිට අවුරුදු 10 දක්වා දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ යොදවා තිබුණි.	මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වා ගැනීමට හා දිනෙන් දින ක්ෂේත්‍ර කටයුතු පුළුල් වන අතර, ඒ සඳහා නව නිලධාරින් බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා ඇතත්, මේ දක්වා ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.	පවත්නා වැඩ බැලීමේ තනතුරු වල කාර්ය භාරය සමාලෝචනය කර තනතුරු වල අවශ්‍යතාවය තීරණය කළ යුතුය.
(ඊ)	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටියේ 4.3.2.2 වගන්තිය	සහකාර අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්) තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී සුදුසුකම් සහ පළපුරුද්ද රහිත නිලධාරිනියක් ඒ සඳහා බඳවාගෙන තිබුණි.	මෙම නිලධාරිනිය විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද ලේඛනවල පැවති ගැටලුකාරී තත්ත්වයක් මත රේඛීය අමාත්‍යාංශයේ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස 547 වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම නිලධාරිනියගේ වැඩ තහනමට ලක්කර ඇත.	බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
(උ)	2015 මැයි 25 දිනැති PED අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය	චක්‍රලේඛයට පටහැනිව MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා 2022 හා 2023 වර්ෂයන් තුළදී රු.මිලියන 3.22 ක් සහ නිලධාරීන් 15 ක් සඳහා 2024 වර්ෂය තුළදී රු.මිලියන 1.18 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.	මෙම දීමනාව ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපි ඉදිරිපත් කර ඇති අතර ,මේ දක්වා ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත .	චක්‍රලේඛය උපදෙස් අනුව ප්‍රවාහන දීමනා ගෙවිය යුතුය.
(ඌ)	2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛයට පටහැනිව වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 4 දෙනෙකු සේවයේ යොදවා අනුමැතියක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 6.79 ක් ගෙවීම් කර තිබුණි.	දීර්ඝ කාලයක් තිස්සේ මෙම පුරප්පාඩු සම්පූර්ණ නොවීම නිසා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීම සඳහා 531/18 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී ඇත. මෙම නිලධාරීන් අතරින් නිලධාරීන් තුන්දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටින, නිලධාරින් දෙදෙනෙකු විශ්‍රාම ගන්වා ඇත.	වයස අවුරුදු 60 සම්පූර්ණ සේවකයන් සේවයේ යෙදවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගත යුතුය.

(එ)	2022ජුලි 8 දිනැති හා 02 / 2022දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 1.2. 5වගන්තිය	යම් නිශ්චිත කාර්යයක් සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත ත්‍යාග/ප්‍රධාන වශයෙන් ලැබෙන මුදල් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් මොබිටෙල් ආයතනය වෙතින් ලද රු.මිලියනයක මුදල එසේ ප්‍රේෂණය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.	මණ්ඩලය විසින් සන්නිවේදන පහසුකම් ලබාගෙන ඇති මොබිටෙල් ආයතනය මගින් රු.මිලියනයක් ලැබී ඇත. මෙම සන්නිවේදන ගෙවීම තුළ සේවකයන්ගේ වැටුපෙන් අයකර ගන්නා මුදල්ද පවතින බැවින් මෙම මුදල සේවක සුභසාධනය සඳහා යෙදවීමට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් මේ වන විට අනුමැතිය ඉල්ලා ඇත. ලැබුණු මුදල මණ්ඩලයේ නමින් පවතින පරිපාලන බැංකු ගිණුම තුළ ශේෂයක්ව පවතී.	මණ්ඩලයට හිමිකම් නොමැති මුදල් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කළ යුතුය.
(ඒ)	2019 සැප්තැම්බර් 02 දිනැති අංක 07/2017 (සංශෝධන II) දරන කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය			
	(i). 3 වගන්තිය	a) නිලධාරීන් අතින් සිදු වන අඩුපාඩු හේතුවෙන් වගාහානි සිදු වූ ගොවීන් සඳහා ගෙවිය යුතු වන්දි අහිමි කර තිබුණු අතර 2022/23 මහ කන්නයේදී මණ්ඩලය වෙත ලද අයදුම්පත් වලින් සියයට 22.41 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. අදාළ නිලධාරීන් රාජකාරි පැහැර හැරීම පිළිබඳව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලිපි කිහිපයක් යොමු කර නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එහිදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් මගින් සිදු වන අඩුපාඩු අවම කර ගෙන වගා රක්ෂණ කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු බවට එම ලිපිය මඟින් දැනුම් දී ඇත.	වන්දි ගෙවීමේදී නිලධාරීන්ගෙන් සිදුවන ප්‍රමාදයන් හා අඩුපාඩු අවම කිරීමට සුදුසු අභ්‍යන්තර ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.
		b) අස්වනු නෙලීමට අපේක්ෂිත දිනට පෙර භෞතික පරීක්ෂාවක් සිදුකර හානිය තක්සේරු කළ යුතු වුවත් අස්වනු නෙලීමෙන් පසු භෞතික පරීක්ෂාව සිදු කර,	අස්වැන්න නෙලා ඇති අවස්ථාවලදී වන්දි ලේඛනවල අස්වනු නෙලා ඇත යනුවෙන් සඳහන්ව ඇත්නම් එවැනි අවස්ථාවලදී වන්දි ගෙවීමට කටයුතු කර නොමැත.එවැනි	අස්වනු නෙලීමට පෙර වගා හානි පරීක්ෂා කළ හැකිවන අභ්‍යන්තර ඇගයීම් ක්‍රමයක්

		''අස්වනු නෙලා ඇත'' යනුවෙන් අයදුම්පත්වල සඳහන් කර, හානියක් නැත ලෙස සලකා 2022/23 මහ කන්නයේ අයදුම්පත් 5 ක්ද 2023 යල කන්නයේ අයදුම්පත් 731 ක්ද 2023/24 මහ කන්නයේ අයදුම්පත් 107 ක් ද සඳහා වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි.	අවස්ථාවලදී ගොවීන්ගේ අභියාචනා ඉදිරිපත් වුවහොත් ඒවා නැවත සලකා බැලීමට කටයුතු කර ඇත.	හඳුන්වා දිය යුතුය.
(ii).	4 වගන්තිය	2022/23 මහ කන්නයට අදාළව වගා හානි සඳහා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කර වන්දි ගෙවීම සඳහා අනුමත වී ඇති ගොවීන් 39,455 දෙනෙකුගෙන්, 9,513 න් දෙනෙකුට, ප්‍රතිශතයක් ලෙස සියයට 25 ක් වෙත වන්දි ගෙවීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි.	2023/24 මහ කන්නයට අදාළ වන්දි ගෙවීම් වලට අදාළ ප්‍රමාද දෝෂයන් සිදු වුවද 2024/25 මහ කන්නයේ සිට වන්දි ගෙවීම කඩිනම් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2024/25 මහ කන්නයේ වගා හානි වූ ගොවීන්ගෙන් සියයට 70 ක් පමණ කන්නය අවසන් වීමට පෙර වන්දි ගෙවා අවසන් කිරීමට කටයුතු කරන ලද අතර සෙසු සියලු වන්දි ජුනි මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.	වන්දි ගෙවීමේ ප්‍රමාදයන් අවම කරගත හැකිවන අභ්‍යන්තර ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.
(iii).	5 වගන්තිය	දිස්ත්‍රික් කාර්යාල 17 ක් විසින් ලබා දුන් තොරතුරු අනුව 2022/23 මහ කන්නයේ වන්දි ලබා දුන් ගොවීන් 30,022 දෙනෙකුගෙන් හදිසි අනතුරු රක්ෂණ වාරික ආදායම ලෙස රු.මිලියන 12.23 ක් රඳවාගෙන තිබුණු අතර ගොවීන් 20,352 ක් වෙත ඔප්පු ලබාදී නොතිබුණි.	වගා හානි වන්දි මුදල් නිදහස් කිරීමේදී වන්දි මුදලින් රක්ෂණ වාරිකය අඩු කර වාර්ෂික හදිසි අනතුරු රක්ෂණ ඔප්පුවක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. වන්දි මුදල් නිදහස් කිරීමෙන් අනතුරුව SMS මාර්ගයෙන් හා වෙබ් පිටුව මඟින් සහ සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම දැන්වීමක් මඟින් හදිසි අනතුරු රක්ෂණ ඔප්පුවක් ඇති බවට දැනුම් දීමට කටයුතු කරන අතර 1918 දුරකථනය ඔස්සේ තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත. රක්ෂණ ඔප්පුවක් නිකුත් කිරීම සඳහා වැය වන පිරිවැය විශාල ලෙස වැඩි වී ඇති බැවින් ඒ සඳහා වෙනම මෙහෙයුම් වියදමක් ගොවීන්ගෙන් ලබා ගත නොහැකි බැවින් මෙම ක්‍රමවේදය තුළින් ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	ඔප්පු ලබා දීම කළ යුතුය.

(ඔ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ)	චක්‍රලේඛය හා සංශෝධිත මුදල් රෙගුලාසි වලට පටහැනිව රු.මිලියන 0.11 සිට රු.මිලියන 9.99 දක්වා වූ පරාසයක් තුළ අත්තිකාරම් ලබාදී තිබුණි. ඒ අනුව විවිධ කාර්යයන් සඳහා අත්තිකාරම් ලබා දීමේදී අවස්ථා 70 කදී උපරිම අත්තිකාරම් සීමාව ඉක්මවා ලබා ගත් තත්කාර්යය අතුරු අග්‍රිමයෙහි වටිනාකම රු.මිලියන 23.69 ක් වූ අතර ප්‍රාග්ධන අත්තිකාරම් යටතේ අවස්ථා 08 කදී ලබා දී තිබූ අත්තිකාරම් හි වටිනාකම රු.මිලියන 31.83ක් විය.	මණ්ඩලයේ විශේෂ මෙහෙයුම් අවශ්‍යතාවයන් පිළිබඳව සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක නිළධාරියෙකු සඳහා ලබාදිය හැකි අත්තිකාරම් මුදල් හි උපරිම සීමාව රු.200,000 කට යටත්ව කටයුතු කිරීමට අනුමැතිය හිමි වී ඇත. තවද, ප්‍රාග්ධන අත්තිකාරම් යටතේ ලබා දෙනු ලබන මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කරන අතර කිසිදු අවස්ථාවක එය වෙළඳ භාණ්ඩ හා සේවා සපයනු ලබන ආයතනයත් වෙත නිදහස් කිරීමක් සිදු නොකරයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළින් ප්‍රසම්පාදන කටයුතු ඉටුකරන බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වූ පසු එහි පියවීම් ලේඛන මණ්ඩලය වෙත ලබා දීමෙන් අනතුරුව මෙම කටයුතු ඉටුකරනු ලබයි.	අනුමත සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දීම සඳහා භාණ්ඩාගාර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.
(ඕ)	2018 දෙසැම්බර් 31 දිනැති හා 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව නිකුත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 2 ඡේදය	ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම තක්සේරු කළ යුතු වුවත් මණ්ඩලය සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබුණි.	ඇඹිලිපිටිය නිල නිවාසය හා මහියංගනය මියුගුණගම නිලනිවසේ තක්සේරු වටිනාකම ලබා ගැනීම වෙනුවනේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තු කාර්යාල වෙත ඉල්ලීම් කර ඇත. මහවැලි 'සී' කලාපයේ, මහවැලි අධිකාරියට අයත් ඞී.කේ.03 දරන ගොඩනැඟිල්ල මණ්ඩලය වෙත පවරා ඇති අතර, එය පිහිටි ඉඩම මණ්ඩලය වෙත පවරා ගැනීමට අදාල කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය කෘෂිකර්ම අමාත්‍යාංශයට පවරා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මඟින් තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමේ ලිපියක් නිකුත් කරන ලෙසට මණ්ඩලීය සභාපතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මණ්ඩලය වෙත පවරා ගැනීමට අදාල කාර්යයන් අවසන් අදියරේ පවතී.එම අමාත්‍යාංශයෙන්	ඉඩම් හා ගොඩනැගිලි අයිතිය පවරාගෙන තක්සේරු කර වත්කම් ලේඛනවල ඇතුළත් කළ යුතුය.

			කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත අදාල ඉඩම හා ගොඩනැඟිල්ල පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	
(ක)	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටිය	අදාළ ශ්‍රේණියට පත්වී වසර 3 ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු වුවත් කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත පරිදි පවත්වා නොතිබුණු නිසා අදාළ කාලය තුළ නිලධාරීන් විභාගය සමත් වී නොතිබුණු නමුත් ඒ පිළිබඳව සැලකිල්ලට නොගෙන බඳවා ගැනීමෙන් අවුරුදු 03 කට පසුව තනතුරෙහි ස්ථිර කර තිබුණි.	වර්තමානය වන විට කාර්යක්ෂමතා කඩඉම් විභාග අදාළ වර්ෂය තුළ නිවැරදිව පැවැත්වීමට කටයුතු කර ඇති බැවින් ඉදිරියේදී නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ කටයුතු නිසි පරිදි සිදු කිරීමට අපේක්ෂා කරයි.	නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතුය.
(ග)	2021 ජනවාරි 26 දිනැති හා අංක 01/2021 දරන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ අභ්‍යන්තර චක්‍රලේඛය	ඉදිරි වැඩසටහන් සකස් කිරීම සඳහා හඳුන්වා දී ඇති පාලන ප්‍රතිපත්ති අංක 1 හි V ඡේදය ප්‍රකාරව සෑම ක්ෂේත්‍ර රාජකාරිවල යෙදෙන නිලධාරීන් පිළිබඳ විස්තරයක් මහජනතාවට දැක ගැනීම සඳහා ප්‍රදර්ශනය කර නොතිබුණි.එසේම හඳුන්වා දී ඇති පාලන ප්‍රතිපත්ති අංක 2 සහ 3 ප්‍රකාරව ක්ෂේත්‍ර රාජකාරිවල යෙදෙන නිලධාරීන් විසින් ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි.	දිස්ත්‍රික් කාර්යාලයන්හි සේවය කරනු ලබන නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ ඉදිරි වැඩසටහන් සහ සියළු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයේ ඉදිරි වැඩසටහන් කාර්යාලය තුළ ප්‍රදර්ශණය කළ යුතුය. සාමාන්‍යයෙන් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරයාගේ රාජකාරි ස්ථානය තුළ ඉදිරි වැඩසටහන් ප්‍රදර්ශනය කිරම සිදුවේ. අවශ්‍යතාවය අනුව මහජනතාව වෙත එය නිරීක්ෂණය කිරීමේ හැකියාව පවතී. ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වල නිරත නිලධාරීන් ක්ෂේත්‍ර සටහන් පොත් නිරන්තර යාවත්කාලීන කරන අතර, කාර්යාලීය කටයුතු සිදු කරන දිනයන්හි බැහැරව යාමට සිදුවන අවස්ථාවල ලොග් සටහන් පොතෙහි සටහන් කරනු ලබයි.	ප්‍රදර්ශනය කළ යුතු ක්ෂේත්‍ර නිලධාරීන් පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීමට පියවර ගත යුතුය.
(ච)	2021 ජනවාරි 27 දිනැති හා අංක 02/2021 දරන තොග පොත නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා වූ චක්‍රලේඛය	මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය යාවත්කාලීන කර තොග පොත් පවත්වා නොතිබුණි.	දිස්ත්‍රික් කාර්යාලය තුළ පවතින ප්‍රාග්ධන භාණ්ඩ ඇතුළුව රාජකාරි අවශ්‍යතා අනුව,භාවිතා කරනු ලබන භාණ්ඩ සම්බන්ධව තොග ලේඛන පවත්වා ගත යුතු අතර ඒ සම්බන්ධව මේ වන විටත් මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය ඇතුළු සියලු දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කිරීම් සිදු කර ඇත.	තොග පොත් යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ (සමූහය) මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 3,182.18 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 3,884.54 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 702.36 ක ඌනතාවය අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම ඌනතාවය අඩුවීමට වගා හානි සඳහා වන්දි ගෙවීම් අඩුවීම, ඒ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලින් ලද දායකත්වය වැඩිවීම හා විශ්‍රාම වැටුප් වගකීම සඳහා වෙන් කිරීම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් 2018 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු බදු මුදල වූ රු. මිලියන 299.35 ක් නියමිත දිනයන්හිදී ගෙවා නොතිබීම හේතුවෙන් ප්‍රමාද පොලිය ලෙස රු. මිලියන 40.87 ක් මණ්ඩලයට ගෙවීමට සිදු ව තිබුණි.	මණ්ඩලය කෘෂි රක්ෂණ හා සමාජ ආරක්ෂණ කටයුතු සිදු කරන බැවින්, 1979 අංක 28 දරන සහ ඊට පසු ක්‍රියාත්මක වූ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත් මඟින් මණ්ඩලයේ සියලු ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර තිබුණි. නමුත් 2017 අංක 24 දරන දේශීය ආදයම් පනත මඟින් එකී නිදහස් කිරීම් ලබා දී නොතිබූ නිසා මණ්ඩලයට ආදායම් බදු ගෙවීමට සිදු වී ඇත. ආදායම් බදු ගණනයේදී සාමාන්‍ය සමාගම් සඳහා වන සියයට 30 ක බදු අනුපාත අනුව බදු ගෙවීමට මණ්ඩලයට සිදුව තිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ වශයෙන් සාකච්ජා කර මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු ආදායම සියයට 14 ක ප්‍රතිශතය අදාළ කර ගෙවීමට කටයුතු කර ඇත. මේ අනුව මණ්ඩලයට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත. මේ අනුව 2024/25 වර්ෂයේ සිට නිවැරදි බදු බැදියාව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදිව බදු බැඳියාව නිරවුල් කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය ප්‍රකාරව කෘෂිකාර්මිකයන්ට සිදුවන පාඩු වෙනුවෙන් ඔවුන්ට හානි පූර්ණය සලසන පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිහිටවිය යුතු වුවත් එලෙස හානි සිදු වූ ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂ සඳහා වූ රු.මිලියන 70.80 ක වන්දි මුදල්, ගිණුම් අංක,ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම මුදල නිරවුල් කිරීමට හෝ	මෙම මුදල් කෘෂි රක්ෂණ වන්දි ගෙවීම් සඳහා ලබා දුන් ප්‍රතිපාදන වන අතර ගෙවීම් කිරීමේදී හිමිකම් නොපාන ලද නැවත මණ්ඩලය වෙත ප්‍රේෂණය වූ මුදලක් වන අතර මෙම මුදල් කෘෂිරක්ෂණ අරමුදල ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව කෘෂි රක්ෂණ අරමුදලට බැර කිරීමට කටයුතු කර ඇත.	ඉදිරිපත් නොවූ වන්දි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය.

	නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට වසර 6 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.		
(ආ)	අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නගින හිමිකම් වෙනුවෙන් යොදා ගත යුතු සංචිත අරමුදලක් 2002 වර්ෂයේ සිට ගොඩනගා ගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.මිලියන 588.52 ක් විය. එම අරමුදල භාවිත කළ යුතු අනපේක්ෂිත සිදුවීම් පිළිබඳව නිර්වචනය කර රීති ගොඩනගාගෙන නොතිබුණු නිසා 2002 වර්ෂයේ සිට මේ දක්වා වසර 22 ක කාලය තුළ මෙම අරමුදල භාවිතා කර නොතිබුණි.	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතෙහි 24 වගන්තිය ප්‍රකාරව "කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් මණ්ඩලය වෙත තිබිය යුතුය යන්න දක්වා ඇත. ඒ අනුව සෑම වර්ෂයකම මෙහෙයුම් ලාභයෙන් සියයට 5 ක ප්‍රතිශතයක් වෙන් කිරීම තුලින් මෙම අරමුදල ගොඩනගා ඇත.මණ්ඩලය විසින් කෘෂිකාර්මිකයින්ගේ දායකත්වය සහිතව ආරම්භ කිරීමට අපේක්ෂා කරන ජීවිත රක්ෂණ හා අනෙකුත් රක්ෂණ යෝජනාක්‍රම සඳහා පැන නගින මූලික ප්‍රාග්ධන හා අතිරේක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනිමෙන් පසුව මෙම අරමුදල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.	අරමුදල ආරම්භ කිරීමේ අවශ්‍යතාවය හා භාවිතය පිළිබඳව ව්‍යවස්ථාවලියක් සකස් කර ඒ සඳහා විධිමත් අනුමැතියක් ගෙන ක්‍රියාත්මක කළ යුතුය.
(ඇ)	2007 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.මිලියන 251.54 ක ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි. යෝජනාක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.මිලියන 295.23 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2024 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.මිලියන 469.03 ක් විය. සමාලෝචිත වර්ෂයේ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 249.63 ක මුදලින් රු.මිලියන 12.59 ක මුදලක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි.	ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම වෙනුවෙන් රක්ෂණ යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ක්‍රියාත්මක වූ අතර, එය පසුව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. 2010 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ගෙවීම් කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මෙම අරමුදලේ මුදල් යොදාගෙන ඇති අතර, එම මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් නැවත අය කරගැනීමේ පදනමින් ලබා දී ඇති අතර, එම ණය මුදල ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.	යෝජනා ක්‍රමයට ආර්ථිකමය වාසි සැලසෙන පරිදි නිවැරදි තීරණ ගත යුතුය.
(ඈ)	මණ්ඩලයේ විවිධ අංශ හා දිස්ත්‍රික් කාර්යාලවල පවත්නා සහ නව දුරකතන 61 ක් ජාලගත කරමින් ටෙලිකොම් ආයතනය මගින් 2023 ජනවාරි මස සිට නව අභ්‍යන්තර දුරකතන ජාල සම්බන්ධතාවයක් ලබා ගෙන තිබුණු අතර 2023 වර්ෂය සඳහා රු.මිලියන 2.26 ක් සහ 2024 වර්ෂය සඳහා රු.මිලියන 4.01 ක් ලෙස බිල්පත් ගෙවා තිබුණද දුරකතන ක්‍රියාකරු වෙත ලැබෙන	ජාලගත කිරීම සිදුකර ඇත්තේ අභ්‍යන්තර දුරකතන හා දිස්ත්‍රික් කාර්යාල දුරකතන එකිනෙකට සම්බන්ධ කරමින් පවතින සම්බන්ධතාවයක් ලෙසයි.දුරකතන ක්‍රියාකරු වෙත ලැබෙන ඇමතුම් දිගු අංක වෙත යොමු කිරීම සඳහා PABX හරහා පමණක් මෙම පහසුකම ලබාගත හැකි අතර, මේ සඳහා මණ්ඩලයට අවම වශයෙන් රු.මිලියන 2.5 ක මුදලක් වැයවන බව ඔවුන් සමඟ පැවැති	වඩාත් සාර්ථක සේවාවක් ලබා දිය හැකි පිරිවැය අවම දුරකතන පහසුකම් ජාලයක් ස්ථාපිත කළ යුතුය.

	ඇමතුම් දිගු අංක වෙත යොමු කිරීමේ (Call Transfer) පහසුකම අභ්‍යන්තර දුරකතන ජාල සම්බන්ධතාවය ලබා ගත් අවස්ථාවේ සිටම ලබා ගෙන නොතිබීම, අනුරාධපුර, දෙහිඅත්තකණ්ඩිය, කිලිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික් කාර්යාලවල දුරකතන සම්බන්ධතා ජාලගතකරණය නොකිරීම, දුරකතන ක්‍රියාවිරහිත කර තැබීම හා ගොවි විශ්‍රාම වැටුප් අංශය හා ධීවර විශ්‍රාම වැටුප් අංශය සඳහා බාහිර පාර්ශවයන් වෙත ඇමතුම් ලබා ගැනීමට හැකිවන පරිදි දුරකතන පහසුකම් ලබා දී නොතිබීම නිසා ගොවීන්, ධීවරයින් හා ධීවර අමාත්‍යාංශයේ දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකික ගොවි ජනතාව වෙත වඩා සාර්ථක සේවාවක් ලබා දීමට අවශ්‍ය පසුබිම සකස්කර ගෙන නොතිබුණි.	සාකච්ඡාවේ දී දැනුම් දුන් අතර,මෙම ගොඩනැගිල්ල බදු කුලී ගිවිසුම මත පවත්වාගෙන යන බැවින් PABX ජාලගත කිරීමට වැයවන පිරිවැය එම ගොඩනැගිල්ලෙන් ඉවත්වුවහොත් මණ්ඩලයට පාඩුවක් වන බැවින්ද මෙම ක්‍රියාවලිය සඳහා තාවකාලික විසඳුමක් ලෙස මෙය ලබාදී ඇත. තවද මණ්ඩලය වෙත ලැබෙන ඇමතුම් පටිගත කිරීමේ පහසුකම ලබා ගැනිමේදි පිරිවැය හා ඵලදායිතාවය පිළිබඳ සැලකීමේදි ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් ඇමතුම් පටිගත කිරීමේ සේවාව ලබා ගැනිමට කටයුතු නොකරන ලදී.	
(ඉ)	1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතේ පනතේ 35 වගන්තිය තුළ දක්වා ඇති පරිදි කෘෂිකාර්මිකයා යනු උද්‍යාන කටයුතු කෘෂිකර්මාන්තයට උද්‍යාන විද්‍යාවට ඖෂධීය පැලෑටිවලට පශු සම්පත්වලට ධීවර කර්මාන්තයට හෝ වන වගාවට අදාළ යම් කටයුත්තක් කරගෙන යන තැනැත්තකු ගොවිජන සේවා කමිටුවක් හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද ගොවි සංවිධානයක් හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමූපකාර පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් හෝ තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ලියාපදිංචි කරන ලද වෙනත් යම් සමිතියක් හෝ යම් රාජ්‍ය නොවන සංවිධානයක් යන පුළුල් අර්ථකථනයක් පැවතුන ද සැබවින්ම මෙම රක්ෂණ හිමියන් මෙවැනි සුලු හෝ කටයුත්තක නිරත වන්නේද යන්න භෞතික හෝ ලිඛිත තහවුරු කර ගැනීමකින් තොරව මෙම රක්ෂණ සහතික ලබා දී තිබුණි. රක්ෂණ හිමියා කෘෂිකාර්මිකයෙකුද යන්න සනාථ කර ගැනීම අදාල රක්ෂණ අයදුම්පත තුළ මුද්‍රණය කර ඇති කොටුව තුල අදාළ කරුණු වලට හරි ලකුණ යෙදීමෙන් පමණක් තහවුරු කර ගෙන තිබුණද ,ඒ සඳහා ගොවීන්ගේ අක්කර බදු නාම	මණ්ඩලය මගින්, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වගා රක්‍ෂණ යෝජනා ක්‍රමය, පශු රක්‍ෂණ යෝජනා ක්‍රමය, සුවසෙත හා හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රමය, ගබඩා රක්‍ෂණ යෝජනා ක්‍රමය, තෙවන පාර්ශවීය රථවාහන රක්‍ෂණ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් රක්‍ෂණ යෝජනා ක්‍රමය ඇතුළුව රක්‍ෂණ යෝජනා ක්‍රම රාශියක් ක්ෂේත්‍රයන් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව, මාසිකව විශාල ප්‍රමාණයක් රක්‍ෂණ අලෙවි කටයුතු සිදුවන බැවින්ද, මණ්ඩලය සතු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය සීමිත බැවින්ද පවතින කාර්යය බහුලත්වය හා ප්‍රායෝගික තත්ත්වය හේතුවෙන් තෙවන පාර්ශවීය රථ වාහන රක්‍ෂණ යෝජනා ක්‍රමය අලෙවි කිරීමේදී පාරිභෝගිකයා කෘෂිකාර්මිකයන්ද යන්න තහවුරු කිරීම සඳහා අයදුම්පත්‍ර මගින් සිදු කිරීමට කටයුතු කරයි. රක්ෂණ මූලධර්මයන්ට අනුකූලව රක්ෂිතයා විසින් නිවැරදි තොරතුරු ලබා දිය යුතු බවට මූලධර්මයක් පවතින අතර එය යෝජනා පත්‍රය තුළින් ලබා දීම සිදු කළ යුතුය. තවද පනතේ කෘෂිකාර්මිකයා යටතට ගැනෙන නිර්නායකයන්ට අදාළව කටයුතු කරනු ලබන කෘෂිකාර්මිකයින් ලියාපදිංචි කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොපවතින බැවින් ප්‍රායෝගිකව මෙම යෝජනා ක්‍රමය සඳයා තහවුරුවක් ලබාගැනීමට හැකියාවක් නොමැත.	කෘෂිකාර්මිකයන් ගේ නිශ්චල හා චංචල දේපළවලට පමණක් තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය.

	ලේඛනය හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සනාථ කර ගැනීමක් හෝ නොතිබුණි.		
(ඊ)	කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ කාර්යාල පිහිටුවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අත්පත්කරගෙන තිබුණු ඉඩමෙන් මූලික පිඹුරු කො.9175 හි කැබලි අංක 02 මගින් පෙන්වා දී තිබුණු ඉඩම් කොටස 2008 වර්ෂයේදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා වෙන්කර දී තිබුණු ඉඩම 2012 වර්ෂය වනවිට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය වෙත කිසිදු විමසා බැලීමකින් තොරව වෙන් කර දී තිබුණි.	ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය ලේකම් අමතා 2008/05/14 දිනැතිව යොමුකරන ලද ලිපිය අනුව කො.7945 මූලික පිඹුරේ කැබලි අංක 01 දරන ඉඩම් කොටස කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය වෙත පවරා දී ඇති අතර, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ එම්ජ්එස් 4/2/9 දරන 2008/03/17 දිනැති ලිපිය මගින් පිඹුරුපත් අංක 7945 ලොට් අංක 01 දියවන්නා වගුර, රජමල්වත්ත, බත්තරමුල්ල පිහිටි හෙක්ටයාර 0.502 කින් යුක්ත ඉඩම් කොටස මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා පවරා දෙන ලෙස ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. මෙම ඉඩම් කොටසෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මණ්ඩලය විසින් ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරිමේ මණ්ඩලය වෙත මුදල් ගෙවා අදාළ ගොඩනැගිල්ලේ සැලැස්ම සඳහා අනුමැතිය ලබාගෙන තිබියදී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් අදාළ ඉඩමෙන් කොටස් 2ක් ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය වෙත හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දී තිබුණි. මෙම ඉඩම් කොටස මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර දෙන ලෙස තවදුරටත් ඉල්ලීම් කර ඇති අතර, 2025 වාර්ෂික අයවැය මගින් රු.මිලියන 400 ක මුදලක් වෙන්කිරීම කර ඇත. අදාළ අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බව දන්වා සිටිමි.	ප්‍රධාන කාර්යාලය ඉදිකිරීමට කටයුතු කළ යුතුය.
(උ)	අනුරාධපුර හරිස්චන්ද්‍ර මාවතේ 354/A නිල නිවස සහිත ඉඩම, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම, අම්පාර ඉන්ද්‍රසාරපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අංක 280001 සිතියම් කැබලි අංක 01 දරන පර්චස් 15 ක ඉඩම, කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම, හම්බන්තොට මිරිජ්ජවිල ඉඩම හා මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රදේශයේ මු.පි.මහ 6656 පිඹුරේ කැබලි අංක 107 ඉඩම මණ්ඩලය වෙත පවරා ගැනීමට දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු	අම්පාර පර්චස් 15ක ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති නමුත්, මේ වන තෙක් අදාළ පසු විපරම් කටයුතු සිදු කිරීම ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේදී උක්ත ඉඩම් කොටස මණ්ඩලය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රදේශයේ ඉඩමේ භුක්තිය මණ්ඩලය වෙත භාර දීම සිදුකර ඇත. ඒ අනුව ඉඩම මණ්ඩලය	ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර ගැනීමට ක්‍රියාකළ යුතුය.

	කරමින් සිටින නමුත් 2024 දෙසැම්බර් 31 දින දක්වාම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	වෙත පවරා ගැනීමට කටයුතු කර ඇත. ඉදිරියේදී මහනුවර දිස්ත්‍රික් කාර්යාලීය නව ගොඩනැගිල්ල මෙම ඉඩමේ ඉදි කිරීමට බලාපොරොත්තු වේ. මහව කාර්යාලය පවත්වා ගෙන යාමට කටයුතු කළ මහව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉඩ ප්‍රමාණය කාර්යාලීය කටයුතු පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් නොවුණු බැවින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මහව නගර සීමාවට ඉතා ආසන්නතම කාර්යාලීය ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගන්නා ලදී.	
(ඌ)	අංක 2014 දරන හා 2017 අප්‍රේල් 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ III කොටසෙහි අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 157 අටවරල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අටවරල ගමේ අ.ග.පි. 1844 හි කැබලි අංක 263 න් කොටසක් 53/2006 අතුරු පිඹුරේ ඒ දරන කොටසින් ප්‍රමාණයෙන් පර්චස් 20 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කාර්යාල කටයුතු සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත 2013 අගෝස්තු 19 දින දක්වා අවුරුදු 30 කට බදු දී තිබුණි. එම නිවේදනයේ 3 (ඇ) උප වගන්තිය ප්‍රකාරව බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු වුවත් 2024 දෙසැම්බර් මාසය වන විටත් මහව ප්‍රාදේශිය කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ නොකර නිශ්කාර්යව පැවතුණි. එම නිවේදනයේ 3(උ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලබන බව දක්වා ඇත.ඒ අනුව මෙම ඉඩම මණ්ඩලයට අහිමි වීමේ අවදානමක් ඇති අතර පර්චස් 20 ක් වන මෙම ඉඩම තුළ මණ්ඩලය සඳහා ප්‍රාදේශීය කාර්යාලයක් ඉදි නොකර වර්ග අඩි 2,064 ක පෞද්ගලික ගොඩනැගිල්ලක් වර්ෂයකට රු.මිලියන 0.66 ක කුලියට ලබාගෙන කාර්යාල කටයුතු පවත්වාගෙන යනු ලබයි.	කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක 157 අටවරල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අටවරල ගමේ අ.ග.පි.1844 හි කැබලි අංක 263 හි කොටසක් 53/2006 අතුරු පිඹුරේ ඒ දරන කොටසේ ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කාර්යාල කටයුතු සඳහා මණ්ඩලය වෙත තිස් අවුරුදු බදු පදනම මත ලබා දී ඇත. එම කාලය 2013.08.19 දින සිට 2043.08.18 දින දක්වා ක්‍රියාත්මක වේ. මේ වන විට අදාළ ඉඩම මණ්ඩලය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු ආරම්භ කර ඇති අතර, අදාළ ඉඩම මණ්ඩලයේ අයිතියට පැවරීමෙන් අනතුරුව කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ.	ඉඩම් පවරාගෙන කාර්යාල කටයුතු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.

(එ)	තෙවැනි පාර්ශව රක්ෂණ ආදායමින් සියයට 5 ක් වෙන් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව දිරි දීමනා අරමුදලක් ගොඩනගා ගෙන තිබූ අතර 2024 වර්ෂයේ අරමුදල සඳහා වෙන් කිරීම රු.මිලියන 18.06 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 38.36 ක් විය.2022 වර්ෂයේ දී රු.මිලියන 8.44 ක්, 2023 වර්ෂයේ දී රු.මිලියන 8.71 ක් සහ 2024 වර්ෂයේ දී රු.මිලියන 10.38 ක් දිරි දීමනා ගෙවීම් කර තිබුණු අතර මෙම අරමුදල පිහිටුවීමට සහ දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත මගින් මණ්ඩලය වෙත මෙවැනි කටයුතු සඳහා බලතල ලබා දී ඇති අතර, ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තෙවන පාර්ශවිය රක්ෂණ ආදායමෙන් සියයට 5 ක ප්‍රතිශතයක් වෙන් කොට මෙම දිරිදීමනා ගෙවීම සඳහා අදාළ අරමුදල ගොඩනගා ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනට රු.මිලියන 38.36 ශේෂයක් පවතින අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ආරම්භ කර දිරිදීමනා ගෙවීම සඳහා යොදාගන්නා බව පෙන්වා දෙමි.	දිරි දීමනා අරමුදල පිහිටුවීමට සහ ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.
(ඒ)	2024 පෙබරවාරි 28 දිනැති හා අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව රජය සතු ව්‍යාපාරවල අරමුදල් සුභසාධන සංගම් හෝ වෙනත් කිසිඳු සුභසාධන කටයුත්තක් සඳහා මාරු නොකළ යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සේවකයින්ට රක්ෂණ ආවරණයක් ලබාදීම සඳහා සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලක් ගොඩනගාගෙන තිබුණු අතර 2024 වර්ෂයේ සමූහයේ දායකත්වය රු.මිලියන 5.22 ක් සහ 2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු.මිලියන 36.27 ක් විය. මෙම අරමුදල පිහිටුවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	සේවකයින්ගේ හා මණ්ඩලයේ දායකත්වය ඇතිව මෙම අරමුදල ගොඩනැගීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගෙන ඇත.මෙම යෝජනාක්‍රමය සුභසාධන සංගමයකට හෝ වෙනත් සුභසාධන කටයුත්තකට මාරු කිරීමක් සිදුකර නොමැති අතර මණ්ඩලයේ හිමිකම් තුළ අරමුදලක් ලෙස දක්වා ඇත. මේ අනුව රු.මිලියන 36.27 ක මුදලක් එම සංචිත තුළ දක්වා ඇත.	භාණ්ඩාගාරය නොවිමසා සුභසාධන සංගම් හෝ වෙනත් කිසිඳු සුභසාධන කටයුත්තක් සඳහා අරමුදල් මාරු නොකළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයේ දායකත්වය ලබාගත් වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 32,149 ක් වූ ධීවරයින්ගෙන් 26,093 ක් වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.	මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. එම නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා අළුතින් බඳවා ගැනීම සිදු නොකරන ලදී. නමුත් නව යෝජනා ක්‍රමයක් යටතේ 2025 වර්ෂයේ සිට බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමයේ නිසි පරිදි මුදල් ගෙවීම් සිදු කර ඇති වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දායකයින් සඳහා ප්‍රතිලාභ ගෙවීම සිදු කරනු ලැබේ.	නියමිත දායකත්වය ලබා දායක මුදල් නිසි පරිදි ගෙවූ අවුරුදු 60 සම්පූර්ණ වූ සියලුම විශ්‍රාමිකයින් වෙත ප්‍රතිලාභ ලබා දිය යුතුය.

(ආ)	අමතර රක්ෂණ ආවරණ යටතට ගැනෙන උවදුරු සඳහා වන්දි මහා භාණ්ඩාගාරයෙන් සහ ජාතික රක්ෂණභාර අරමුදලෙන් මූල්‍යනය කළ නොහැකි නමුත් වගා හානියට හේතුව එකකට වඩා වැඩියෙන් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති 2022/23 මහ කන්නයේ හානියටපත් වගාබිම් අක්කර 2,190 ක ගොවීන් 1,111 ක් වෙත ජාතික රක්ෂණභාර අරමුදලෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් මුදලින් රු.මිලියන 35.35 ක් වන්දි මුදල් ගෙවා තිබුණි.	බෝග රක්ෂණය සඳහා වන අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයේ මූලික වාරික මුදල ගොවියාගෙන් අයකර ගැනීමකින් තොරව මහාභාණ්ඩාගාරය විසින් ලබා දීමේ පදනම මත මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙහිදී වන්දි ගෙවීමේදී ස්වාභාවික විපත් හා වන අලින්ගෙන් සිදුවන හානි වෙනුවෙන් හානි පූර්ණය කිරීම සිදු කරනු ලබයි. මූලික හානියක් යටතට ගැනෙන හානි සිදුවීමක් සමඟ වෙනත් අමතර හානි සිදුවී ඇති අවස්ථා වලදී මූලික වාරික මුදල ලබා දිය යුතු නිසා මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර රක්ෂණ මූලධර්මයන්ට අනුව මූලික වාරික මුදල නොමැතිව හා මූලික ආරක්ෂණය නොමැතිව රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කළ නොහැක. එම නිසා මූලික ආවරණය සහිතව වෙනත් අමතර ආවරණයකින් හානි වුවහොත් පමණක් මුදල් ඉල්ලුම් කර ඇත.	අමතර රක්ෂණ ආවරණ යටතේ වූ උවදුරු සඳහා වන්දි ගෙවීමට මණ්ඩලයේ අරමුදල් යොදාගත යුතුය.
(ඇ)	1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතෙහි 6(1) වගන්තිය ප්‍රකාරව, අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් එම වයස සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගෙන විශ්‍රාම වැටුප ගෙවීම් කර නොතිබුණු අතර 15(1) වගන්තිය ප්‍රකාරව, පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභී පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි.	ගොවීන් වෙත සහතික ඔප්පුව නිකුත් කර ඇති අතර, ප්‍රතිලාභ හිමිවන කාල සීමාව ඒ තුළ දක්වා ඇත. වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගොවීන් වෙත විශ්‍රාම වැටුප් ලබා ගැනීම පිළිබඳ දැනුවත් කර ලිපි යැවීමත් හා වයස සම්පූර්ණ ගොවීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ සියලු ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත. වාරික 05 ක් ලෙස සලකන්නේ වගා කන්න 05 කි. මෙම කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් සිදු නොකරන ලද ගොවීන් වෙත වාරික ගෙවීම සඳහා සහන කාල පරිච්ඡේදයන් මණ්ඩලය විසින් ලබා දී ඇති අතර එම කාල සීමාව තුළදීද අඛණ්ඩව වාරික 05 ක් නොගෙවන ලද ගොවීන්ගේ ප්‍රතිලාභ ගෙවීම සිදු කර නොමැත. නමුත් අවසන් වාරිකය ගෙවීමට නියමිත දිනය වන විට වාරික ගෙවා ඇති දායකයින් සඳහා විශ්‍රාම වැටුප අහිමිවීමක් නොවන අතර, එම දායකයින් සඳහා ගෙවීම් කිරීමට උපදේශක කාරක සභාවේ නිර්දේශය ලබාගෙන ඇත.	වයස අවුරුදු 60 සම්පූර්ණ කළ අයගේ විශ්‍රාම වැටුප් නොපමාව ගෙවීම් කළ යුතු අතර වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳ දායකයා දැනුවත් කළ යුතුය.
(ඈ)	ගොවි විශ්‍රාම වැටුප් යොජනා ක්‍රමයේ දායකයින් වෙත නිකුත් කර තිබුණු සහතික ඔප්පුවේ 6 වගන්තිය ප්‍රකාරව ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි.	ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් 75 ක් ගෙවා ඇති දායකයින් සඳහා ප්‍රතිලාභ අහිමිවීමක් සිදුනොවන අතර, සාමාන්‍ය පරිදි අනුපාතික විශ්‍රාම වැටුපක් දැනටමත් ගෙවාගෙන යනු ලැබේ.එසේ නියමිත වාරික මුදල් ගෙවා නොමැති එහෙත් සියයට 75 ක් වාරික මුදල් ගෙවා ඇති දායකයින් සඳහා අනුපාතික විශ්‍රාම වැටුපක් ගෙවීමට අදාළව උපදෙස් ලබා ගැනිම සඳහා උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කිරිමට අපේක්ෂා කෙරේ.	අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබීම මත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි නොකළ යුතුය.

(ඉ)	1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 5(1) වගන්තිය ප්‍රකාරව, වයස අවුරුදු 18 සහ 59 අතර යම් ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු යෝජනාක්‍රමයට ධීවර විශ්‍රාම වැටුප් සාමාජිකයන් බඳවාගෙන නොතිබුණු අතර 7 වගන්තිය ප්‍රකාරව,යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ යුතු වුවත් 2007 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයන් 141 ක් සඳහා රු.මිලියන 4.24 ක් සහ 2023 සහ 2024 වර්ෂවලදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයින් 56 ක් සඳහා රු.මිලියන 1.32 ක් ලෙස එකතුව රු.මිලියන 5.56 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය සඳහා දායකයින් බඳවා ගැනීමට අදාළව ගැසට් අංක 13/2438 මඟින් නව බඳවා ගැනීම් සඳහා කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.හිඟ විශ්‍රාම වැටුප් ක්‍රමිකව ඉදිරියේදී ගෙවීමට කටයුතු කරනු ලැබේ.	යෝජනාක්‍රමයට නව සාමාජිකයින් බඳවා ගැනීමත්, වයස අවුරුදු 60 සම්පූර්ණ වන විට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.
(ඊ)	2023 යල කන්නයේ වන්දි ගෙවීම් තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේදී ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් නොකිරීම සහ වැරදි ලෙස සටහන් කිරීම සිදුකළ අවස්ථා පැවති අතර මේ හේතුවෙන් ගොවියෙකු වෙත එකම කන්නයකදී ගෙවීම් කිහිපයක් පවතීද යන්න පරීක්ෂා කිරීමට පහසුකම් සලසාගෙන නොතිබුණි.	2023 යල කන්නයේ වන්දි ගෙවීම සඳහා තොරතුරු ඇතුළත් කිරීමේදී ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගොවි හැඳුනුම්පත භාවිතා කර ඇත. ඒ අනුව වන්දි ගෙවීම් සිදු කරන ලද අතර මේ වන විටත් ජාතික හැඳුනුම්පත අනිවාර්ය කර ඇත.එක් ගොවියෙකුටම එකම කන්නයකදී වන්දි ගෙවීමේදී මෙම අංක පිළිබඳ අවධානය යොමු කර වැඩිදුර වන්දි ගෙවීමට ඇති අවස්ථා උපරිමයෙන් අවම කිරීමට කටයුතු කර ඇත.	තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය හා තිබිය යුතු මූලික තොරතුරු පිළිබඳ අධ්‍යයනය කර ඒවා ඇතුළත් වන පරිදි නිවැරදිව පවත්වා යාවත්කාලීන කළ යුතුය.
(උ)	2022/23 මහ කන්නයේ වන්දි ගෙවීම් තොරතුරු අනුව, එකම වන්දි අයදුම්පතෙහි වගා හානිය සිදුවීමට හේතුව ලෙස නොමිලේ රක්ෂණය හිමිවන වගා හානි හේතු සහ අමතර රක්ෂණ ආවරණය මඟින් ආවරණය වන වගා හානි හේතු යන දෙකම සඳහන් කර තිබුණු අතර වගා හානියට හේතුව නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.	එකම ඉඩමක් නොමිලේ රක්ෂණය හිමි වන ගංවතුර, නියඟය හෝ වන අලි හානි මඟින් මෙන්ම අමතර රක්ෂණය ගෙවා කරනු ලබන හානි මඟින්ද එකවර හානි වීමක් සිදු විය හැකිය. 2022/23 මහ කන්නයේ වන්දි ගෙවීම් වලදී නියමිත දත්ත පද්ධතියක් භාවිතා නොකළ අතර මේ වන විට පිළිගත හැකි දත්ත පද්ධතියක් අනුගමනය කර වන්දි ගෙවීමට කටයුතු කර ඇති බැවින් වගා හානියට හේතුව පැහැදිලිව හඳුනා ගත හැකි පරිදි තොරතුරු ඇතුළත් කරමින් වන්දි ගෙවීමට කටයුතු කරනු ලැබේ.	වගා හානියට හේතුව නිවැරදිව හඳුනාගෙන ඒ අනුව ගෙවීම් කළ යුතුය.

(ඍ)	අමතර රක්ෂණ ආවරණ සහතිකපත් ලබාදුන් රක්ෂිතයින් කොපමණ සිටීද යන්න පරීක්ෂා කිරීමට හැකි ලෙස මණ්ඩලය විසින් අමතර රක්ෂණ ආවරණ සහතිකපත් නිකුත් කළ ගොවීන් පිළිබඳව තොරතුරු ලේඛනයක සටහන් කර පවත්වා නොතිබුණි.	අමතර ආවරණ සහතිකයක් ලබා දුන් ගොවීන් සංඛ්‍යාව පිළිබඳ වාර්තා දිස්ත්‍රික් මට්ටමින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් එම තොරතුරු ලබා ගෙන ඉදිරියේදී ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.	අමතර රක්ෂණ ලබාගත් ගොවීන් පිළිබඳව තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතුය.
(එ)	වන්දි අයදුම් කරන ලද අමතර රක්ෂණ ආවරණ ලබා ගත් ගොවීන්ගේ තොරතුරු ලැයිස්තුවක් වෙනම පිළියෙල නොකර එම තොරතුරු නොමිලේ රක්ෂණය යටතේ වන්දි ඉල්ලුම් කරන ගොවීන්ගේ තොරතුරු තුළම පවත්වා තිබුණි. ඒ හේතුවෙන් වන්දි ගෙවන ගොවීන් අතරින් නොමිලේ රක්ෂණය හිමි ගොවීන් සහ අමතර රක්ෂණය හිමි ගොවීන් වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි.	අමතර ආවරණ සහතිකයක් ලබා දුන් ගොවීන් සංඛ්‍යාව පිළිබඳ වාර්තා දිස්ත්‍රික් මට්ටමින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් එම තොරතුරු ලබා ගෙන ඉදිරියේදී ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.	අමතර රක්ෂණ ආවරණ ලබාගත් ගොවීන් වෙන වෙනම හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වාගෙන යා යුතුය.
(ඒ)	චක්‍රලේඛ ප්‍රතිපාදනයකින් තොරව අමතර රක්ෂණ ආවරණ ලබාගත් ගොවීන් සඳහා හදිසි අනතුරු රක්ෂණ ආවරණයක් හිමි නොවුනද, වගාවට හේතුව නිශ්චිතවම කෘමි උවදුරු ලෙස සඳහන් කර තිබෙන , 2022/23 මහ කන්නයේ ගොවීන් 1,076 ක් සඳහා වන්දි මුදල් ගෙවීම් කිරීමේදී රු.මිලියන 0.50 ක් හදිසි අනතුරු රක්ෂණ ආවරණය සඳහා මණ්ඩලය විසින් රඳවා ගෙන තිබුණි.	චක්‍රලේඛ ප්‍රතිපාදන මත අමතර රක්ෂණාවරණය ලබා ගත් ගොවීන් සඳහා හදිසි අනතුරු රක්ෂණාවරණයක් හිමි නොවුනද වගා හානියට හේතුව නිශ්චිතව කෘමි උවදුර ලෙස සඳහන් කරන අවස්ථාවලදී හදිසි අනතුරු සඳහා මණ්ඩලය විසින් හදිසි අනතුරු රක්ෂණාවරණයක් ලබා දීමට කටයුතු කර ඇති අතර මේ වන විට එම තත්ත්වය මග හරවා ගැනීමට කටයුතු කර ඇත. ඒ පිළිබඳ දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	නොමිලේ රක්ෂණය යටතේ වන්දි හිමිවන ගොවීන්ගෙන් පමණක් හදිසි අනතුරු රක්ෂණ වාරික අයකළ යුතුය.
(ඔ)	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ දී විශ්‍රාම වැටුප් ඉල්ලුම් කිරීමට අදාළ අයදුම්පත් ගොවීන් විසින්ම තම සහතික ඔප්පු පරීක්ෂා කර අදාළ කාලය තුළ මණ්ඩලය වෙත ගෙනැවිත් භාරදිය යුතු බවට ගොවීන් දැනුවත් කර නොමැති අතර ගොවි දායකයා විසින් විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වුවහොත් ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන සමඟ ප්‍රමාදය සඳහා හේතු සඳහන් ලිපියක් ගොවියාගෙන් ලබා ගෙන තිබුණි. එසේම වයස අවුරුදු 60 සම්පූර්ණ වූ නමුත් 2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප්	බඳවා ගැනීමේදී යෝජනා ක්‍රමයට දායකත්වය සපයන ආකාරය සහ ප්‍රතිලාභ ලබා ගන්නා ආකාරය පිළිබඳව ගොවීන් දැනුවත් කරන ලදී. මණ්ඩලය විසින් ගොවීන් වෙත සහතික ඔප්පුව නිකුත් කර ඇති අතර, ගොවීන් වෙත ප්‍රතිලාභ හිමිවන කාල සීමාව ඒ තුළ දක්වා ඇත.වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගොවීන්ට වෙත විශ්‍රාම වැටුප් ලබා ගැනීම පිළිබඳ දැනුවත් කර ලිපි යැවීම මේ වන විට සිදු කරමින් පවතී. මේ අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විගසම ගොවීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ දී ගොවීන් සඳහා විශ්‍රාම වැටුප් ලබා දීම කළ යුතු ය.

	නොලබන සංඛ්‍යාව නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.		
(ඔ)	මාවිල් ආරු සොරොව්ව වැසීම නිසා ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම සඳහා රු. මිලියන 7 කට වැඩි මුදලක් 2006 වර්ෂයේ දී ගෙවීම් කර තිබුණු අතර මේ සම්බන්ධව ගොනු කරන ලද නඩුව නීතිපති උපදෙස් සඳහා 2007 නොවැම්බර් 30 දින යොමුකර තිබුණු අතර කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි.	මෙම නඩුවේ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර අදාළ නඩුව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසීමට කටයුතු කරනු ලැබේ.	ගොනු කරන ලද නඩු සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය.
(ක)	2008 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීම් නතර කිරීම හා 2012 හා 2014 වර්ෂවල ගොවි විශ්‍රාම වැටුප් නොගෙවීම නිසා යෝජනා ක්‍රමය පිළිබඳ ගොවීන් තුළ තිබුණු විශ්වාසය කඩවීම හේතුවෙන් ගොවීන් විසින් දායක මුදල් ගෙවීම් නතර කර දැමීම නිසා නොකඩවා වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති ගොවීන් 918කට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක528 / 03 හා 543/ 01මගින් විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. නමුත් විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී ගෙවිය යුතු මුළු වාරික ප්‍රමාණයම ගෙවා ඇති අනෙකුත් ගොවීන් සඳහා විශ්‍රාම වැටුප අහිමි නොකිරීමට හා අඩු කළ විශ්‍රාම වැටුපක් සකස් නොකිරීමට පොදු එකඟතාවයක් ලබා නොගැනීම නිසා සියලුම වාරික ගෙවූ එහෙත් මණ්ඩලයේ ගණනය කිරීම අනුව නොකඩවා වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති අනෙක් ගොවීන්ට විශ්‍රාම වැටුප අහිමි කර හා අඩු කළ විශ්‍රාම වැටුපක් සකස් කර තිබුණි.	විගණන නිරීක්ෂණ අනුව නියමිත වාරික වලින් සියයට 75ක් ගෙවා අවසන් කර ඇති නමුත් පිළිවෙලින් වාරික 05 ගෙවීම පැහැර හැරීම නිසා දායකත්වය අවලංගුවී ඇති දායකයන් සඳහාද විශ්‍රාම වැටුප් ලබා දීමට සහනයක් සැලසීම සඳහා 2025.03. 24 දින පැවති 546 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. මෙය උපදේශක කාරක සභාවට ඉදිරිපත්කර අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලැබේ .	සියලුම වාරික මුදල් ගෙවූ දායකයින්ට විශ්‍රාම වැටුප් ප්‍රදානයේදී අදාළ හිමිකම් අහිමි නොවන ආකාරයට පොදු එකඟතාවයකින් කටයුතු කළ යුතුය.
(ග)	මාස 6 ක් අඛණ්ඩව ධීවර විශ්‍රාම වැටුප ලබා නොගත් විශ්‍රාම වැටුප් හිමියන්ගේ නම් මියගිය බව හෝ එසේ නොගැනීමට බලපාන්නා වූ හේතු තහවුරු කරගෙන එම ලැයිස්තු හා හේතු සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව විශ්‍රාම වැටුප් ගෙවීම් නාමලේඛනයෙන් ඉවත්කර තිබුණි.	උපදේශක කාරක සභාවේ නිර්දේශයන් මත අදාළ ගෙවීම් නතර කර ඇති අතර, අදාළ ධීවරයින් ඉදිරිපත් වුවහොත් ගෙවීම් සිදුකිරිමට අපේක්ෂා කෙරේ .	ජීව දත්ත තොරතුරු තහවුරු කර ගැනීමකින් පසුව පමණක් විශ්‍රාම වැටුප් නාමලේඛනයෙන් ඉවත්කළ යුතුය.

(ච)	වයස අවුරුදු 60 සම්පූර්ණ වී වාරික මුදලින් සියයට 75 කට වඩා අඩුවෙන් ගෙවන ලද ධීවරයින් සඳහා ශුද්ධ වාරික මුදල් ආපසු ගෙවීමට මාස 3 සිට මාස 78 ක කාලයක් ගතකර තිබුණි.	මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය තුළ එක් සේවකයෙකු පමණක් සේවය කරනු ලබන අතර ඉදිරියේදී නව යෝජනා ක්‍රමය ආරම්භ කිරීමත් සමඟ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් අනුයුක්ත කර ධීවරයින් වෙත කඩිනමින් මෙම ගෙවීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.	ධීවරයන්ට ශුද්ධ වාරික මුදල් ආපසු ගෙවීම අවම කාලයක් තුළ සිදු කිරීමට කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් 2022 වර්ෂයේදී රු.මිලියන 20.39 ක මුදලක් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර එම වර්ෂයේදි ඒ සඳහා රු.මිලියන 23 ක් වැයකර තිබුණද 2024 වර්ෂය වන විටත් වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා කර නොතිබුණි.	පද්ධතිය වෙත දත්ත හා තොරතුරු ඇතුළත් කිරීම සඳහා ක්ෂේත්‍රගත නිලධාරීන් සතුව සුදුසු තාක්ෂණික උපකරණ නොමැති වීම හේතුවෙන් මෙම පද්ධතිය ක්ෂේත්‍රගත කටයුතු සඳහා යොදා ගැනීම අපහසු වී ඇත. තවද, තත්කාලීන කාලගුණ දත්ත මණ්ඩලය වෙත කඩිනමින් හා මූල්‍ය වැය බරකින් තොරව ලබා ගැනීමට අපහසු වීම හේතුවෙන් පද්ධතිය හරහා වන්දි ගණනය කිරීමේ කටයුතු සිදු කිරීමට අපහසු වී ඇත.	කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය පිහිටුවීමේ අරමුණු සහ ඉටු කර ගත හැකි සේවාවන් ලබාගත යුතුය.
(ආ)	ඇඹිලිපිටිය නිල නිවස, මහියංගනය නිල නිවස, අනුරාධපුර නිල නිවස, හම්බන්තොට මිරිජ්ජවිල ගොඩනැගිල්ල හා මනම්පිටිය, මහනුවර, මහව හා අම්පාර ඉඩම් මණ්ඩලය විසින් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.	අම්පාර ඉඩම් කොටස මණ්ඩලය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත. මහනුවර ඉඩම මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර ඇත. ඉදිරියේදී මහනුවර දිස්ත්‍රික් කාර්යාලීය නව ගොඩනැගිල්ල මෙම ඉඩමේ ඉදි කිරීමට බලාපොරොත්තු වේ. මහව කාර්යාලය පවත්වා ගෙන යාමට කටයුතු කළ මහව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉඩ ප්‍රමාණය කාර්යාලීය කටයුතු පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් නොවුණු බැවින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මහව නගර සීමාවට ඉතා ආසන්නතම කාර්යාලීය ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගන්නා ලදී.	මණ්ඩලය සතු ඉඩම් හා දේපල ආර්ථිකමය වශයෙන් ඵලදායි කාර්යයන්වල යෙදවිය යුතුය.
(ඇ)	මණ්ඩලය සතුව හම්බන්තොට, මනම්පිටිය, මහනුවර, මහව හා අම්පාර යන ප්‍රදේශවල ඉඩම් පැවතියද එම නගරවල පිහිටා ඇති මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල, 2024 වර්ෂය සඳහා රු.මිලියන 4.30 ක වාර්ෂික කුලියක් ගෙවමින් කුලී පදනමට ගොඩනැගිලි ලබාගෙන පවත්වාගෙන යන අතර එම ඉඩම් සංවර්ධනය කර කාර්යාල පහසුකම් සලසා ගෙන නොතිබුණි.	-එම-	මණ්ඩලය සතු ඉඩම් සංවර්ධනය කර කාර්යාල පහසුකම් සලසා ගත යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති (ERP System) සඳහා 2023 වර්ෂය වන විට රු.මිලියන 72 ක් ගෙවා තිබූ අතර පසුව ගිවිසුම් කාලය 2025 අප්‍රේල් 01 දක්වා දීර්ඝ කර ගෙන තිබුණද, 2025 මැයි 02 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.	මණ්ඩලීය මෙහෙයුම් හා ගිණුම්කරණ කටයුතු සිදු කිරීම සඳහා මිල දී ගත් ERP දත්ත පද්ධතියේ ඇතැම් මොඩියුලයන් මේ වන විටත් භාවිත තත්ත්වයේ පවතින අතර අනෙකුත් මොඩියුලයන් සරිලන පරිදි යම් යම් වෙනස්කම් නවීකරණය කරමින් පවතින අතර මෙම කටයුතු මෙම වර්ෂය තුළදී සම්පූර්ණ කර මණ්ඩලය සම්පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය කිරීමට හැකිවනු ඇත.	ගිවිසුම් පරිදි කාර්යයන් ඉටු කර ගත යුතුය.

3.6 වාහන පද්ධතිය කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	චෙසි අංක 116-001866 දරන හා 6ශ්‍රී 8175 අංක දරන මෝටර් කාර් රථයේ ලියාපදිංචි සහතිකය පමණක් පවතින අතර මෝටර් රථය ආයතනය සතුව භෞතිකව නොතිබුණි.	මෙම වාහන සම්බන්ධයෙන් 574 වන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අදාළ මෝටර් රථ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ .	වාහනයෙහි අයිතිය වෙනස් නොවීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි විරෝධතාවයක් ගොනු කර අභ්‍යන්තර පරික්ෂාවක් සිදුකළ යුතුය.
(ආ)	චෙසි අංක AA2AS-813735-A දරන හා 6 ශ්‍රී 3174 අංක දරන මෝටර් රථයේ ලියාපදිංචි සහතිකය පමණක් මණ්ඩලය සතුව පවතින අතර මෝටර් රථය භෞතිකව ආයතනය සතු නොවූ අතර, මෙම මෝටර් රථය සම්බන්ධයෙන් වෙනත් කිසිදු තොරතුරක් ආයතනය සතුව නොවීය. මෝටර් රථයේ ලියාපදිංචි සහතිකය ආයතනය සතුව පැවතියදී ආයතනයේ අනුදැනුමකින් තොරව එහි අයිතිය වෙනත් අයෙකුට පැවරී තිබුණි.	-එම-	අභ්‍යන්තර පරික්ෂාවක් සිදුකර වාහනයෙහි අයිතිය වෙනස් වීම පිළිබඳ සොයා බැලිය යුතුය.